ඉරක්කාමම් ප්‍රාදේශීය සභාව

අම්පාර දිස්ත්‍රික්කය

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2012 අප්‍රේල් 02 දින විගණනය සඳහා ඉදිරිපත් කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2012 සැප්තැම්බර් 06 දින සභාවේ සභාපතිවරයා වෙත නිකුත් කරන ලදි .

1.2 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව ඉරක්කාමම් ප්‍රාදේශීය සභාවේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත් ,මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2011 දෙසැම්බර් 31 දිනට ඉරක්කාමම් ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

1.3.1 ගණකාධිකරණ අඩුපාඩු

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (2) වගන්තිය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනයන්හි විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණි.

2 මූල්‍ය සහ මෙහෙයුම් සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනයන් අනුව 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු.267,647 ක් විය .

## 2.2 මූල්‍ය පාලනය

පහත සඳහන් මූල්‍ය පාලන අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) පොදු වෙළඳ පොල සහ මස් වෙළඳ සැල් සඳහා සභාව වෙත ලැබිය යුතු රු.530,210 ක් වූ හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) එකතු කළ අගය මත බදු රු.237,998 ක් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය නොකොට තැන්පතු ගිණුමෙහි රඳවා ගෙන තිබුණි.

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම , තථ්‍ය ආදායම සහ හිග ආදායම .

සභාපතිවරයා විසින් ඉදිරිපත් කරන ලද පරිදි සමාලෝචිත වර්ෂය සඳහා ඇස්තමේන්තුගත ආදායම , තථ්‍ය ආදායම සහ හිග ආදායම පහත දැක්වේ.

| | ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිග ආදායම |
|---|---|---|---|---|
| | | රු. 000 | රු. 000 | රු. 000 |
| (i) | බදු කුලී | 995 | 796 | 1,036 |
| (ii) | බලපත්‍ර ගාස්තු | 120 | 305 | - |
| (iii) | වෙනත් ආදයම් | 140 | 47 | - |

### 2.3.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු

2011 දෙසැම්බර් 31 දිනට පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරින්ගෙන් උසාවි දඩ රු.82,500 ක් සහ මුද්දර ගාස්තු රු.149,916 ක් අයවිය යුතුව තිබුණි.

## 2.4 මානව සම්පත් කළමනාකරණය

-------------------------------------
අනුමත සහ තථ්‍ය කාර්ය මණ්ඩලය
----------------------------------------
2011 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත සහ තථ්‍ය කාර්යය මණ්ඩලය පහත දැක්වේ.

| තනතුරු වර්ගය | අනුමත | තථ්‍ය |
|---|---|---|
| විධායක ශ්‍රේණි | 01 | - |
| සහායක ශ්‍රේණි | 08 | 12 |
| සුළු ශ්‍රේණි | 10 | 09 |
| | 19 | 21 |

2.5 අභ්‍යන්තර විගණනය

-------------------------

ආයතනය තුල ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

3 පද්ධති හා පාලන

-----------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) මූල්‍ය පාලනය

(ඇ) ආදායම් පරිපාලනය

(ඈ) වත්කම් කළමනාකරණය

(ඉ) කොන්ත්‍රාත් පරිපාලනය